# මාරාන්තික වකුගඩු රෝගයට වැසි ජලයෙන් විසඳුමක්

**රජරට ප්‍රදේශයේ ජනතාව වසර ගණනාවක් තිස්සේ පීඩා විඳින වකුගඩු රෝගයට වැසි ජලයෙන් විසඳුමක් ලබා දිය හැකි බව හන්තාන මූලික අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂක මහාචාර්ය සමන් සේනවීර මහතා ඇතුළු පර්යේෂක කණ්ඩායමක් පවසති. ඉදිරියේදී එළඹෙන්නේ වර්ෂා කාලයයි. දැන් සිටම ඒ සඳහා ක්‍රියාත්මක වීමෙන් විසඳුමක් ලබා ගත හැකිය. කෙසේ වෙතත් ආරම්භයේදී උතුරු මැද පළාතට පමණක් සීමා වී තිබූ මෙම නිදන්ගත වකුගඩු රෝගය (Chronic Kidney Disease) මේ වන විට අනුරාධපුරය, පොළොන්නරුව, මුලතිව්, වව්නියාව, අම්පාර, කුරුණෑගල, බදුල්ල, මොණරාගල, මාතලේ, හම්බන්තොට ආදී ප්‍රදේශයන් දක්වා ව්‍යාප්ත වෙමින් පවතී. මේ අතුරින් වැඩිම වකුගඩු රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ අනුරාධපුරයෙනි. හුදෙකලාව ඔබ ප්‍රදේශයටත් ව්‍යාප්ත නොවේ යැයි කිව හැක්කේ කාටද?**

කාලයක් තිස්සේ පවතින මෙම වකුගඩු රෝගය ගැන, බොහෝ දෙනෙක් විවිධ අදහස් පළකළ ද, එය ඇති වීමට බලපා ඇති නිශ්චිත හේතුව තවමත් අපැහැදිලිය. මෙම ගම්මානවල ජනතාව බොහෝ විට තම පානීය ජල අවශ්‍යතාවන් සපුරා ගනු ලබන්නේ පොළොව හැරීමෙන් සකස් කළ සිධකට විවෘත කළ ළිං මගිනි. මෙම ළිං ජලයේ ෆ්ලෝරයිඩ් අයන වැඩි සාන්ද්‍රණයක් (අංශු මිලියන කොටස් 2 - 4 ප්‍රමාණයක්) පැවතීම හා කැල්සියම් හා මැග්නීසියම් ලවණ දියවීම නිසා ජලයේ කඨින (Hard Water) ස්වභාවයක් දක්නට ඇත.

මේ නිසා එම ජලයේ ගුණාත්මක භාවය දියුණු කිරීම තුළින් වකුගඩු රෝගය ඇතිවීම වැළැක්වීම සහ එය වර්ධනය වීම පාලනය කළ හැකි බව මෙම විද්‍යාඥයින්ගේ අදහසයි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා යුනිසෙෆ් ආයතනය එක්ව අනුරාධපුරයේදී සිදු කරන ලද අධ්‍යයනයකින් පෙන්වා දී ඇත්තේ වකුගඩු රෝගයේ ව්‍යාප්තිය පිරිසිදු පානීය ජලය ලබා දීම තුළින් අඩුකර ගත හැකි බවයි. ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් සිදුකර ඇති අධ්‍යයනයකින් ද රජරට ප්‍රදේශයේ වකුගඩු රෝගය පැතිරෙන ප්‍රදේශවල ජනතාවට උසස් ගුණාත්මයකින් යුත් පානීය ජලය ලබාදීමට ප්‍රමුඛත්වය ලබා දිය යුතු බවට නිර්දේශ කර ඇත.

ඒ සඳහා හොඳම විසඳුම වන්නේ රජරට ප්‍රදේශයේ ග්‍රාමීය නිවාසවල වහලවලින් එකතු වන වැසි ජලය පිරිසිදු පානීය ජලය වශයෙන් ලබාදීමය. මෙය වඩාත් ඵලදායී අඩු වියදම් සහිත පරිසර හිතකාමී හා සමාජීය වශයෙන් වඩාත් පිළිගත් ක්‍රමයකි.

වැසි ජලයේ තත්ත්වය රැක ගන්නේ මෙහෙමයි

සාමාන්‍ය ජල මූලාශ්‍ර හැකිනම් ළිංවලින් මෙන් අපද්‍රව්‍ය, වැසි ජලයේ එකතු නොවන නිසා එය පිරිසිදු තත්ත්වයේ පවතී. නොමිලේ ලැබෙන සම්පතකි. ක්‍රමවත්ව සහ පිරිසිදුව පවත්වා ගෙන යන වහලය මත පතිත වන ජලය සාමාන්‍යයෙන් පිරිසිදු කිරීමකින් තොරව භාවිත කිරීමට හැකියාව පවතී. අධික වශයෙන් නාගරීකරණය හා කාර්මීකරණය වූ ප්‍රදේශ හැරුණු විට වායුගෝලයේ පවතින වැසි ජලය පිරිසිදු මට්ටමේ පවතී. එය අපවිත්‍ර වීම සාමාන්‍යයෙන් සිදු වන්නේ වහලය මතදීය.

මේ නිසා තම නිවසේ වහලය නිතරම පිරිසිදු තත්ත්වයෙන් පවත්වා ගෙන යාම, භාවිත කළ ජලය ඉවත් කිරීම පිළිබඳව නිරතුරුව අවධානයෙන් සිටීම මගින් පිරිසිදු ජලය ලබා ගත හැකිය. එසේම දිගු වියළි කාලයකට පසුව නිවාස වහල මතුපිටින් ජල ගලන් මගින් සෝද හැරීම, සරල ෆිල්ටරයක් මාර්ගයෙන් ජලයේ පවතින අපද්‍රව්‍ය ඉවත් කිරීම ආදියෙන් ජලයේ තත්ත්වය වැඩි දියුණු කිරීමට ද හැකියාව පවතී. තවදුරටත් ජලය පිරිසිදු කර ගැනීම සඳහා නටන තෙක් රත් කිරීම, ක්ලෝරීන් මිශ්‍රකිරීම වැනි ක්‍රියාමාර්ගවලට ද යා හැකිය. ජල ටැංකිය හා එහි විවරය ක්‍රමවත් ලෙස වසා තැබීමෙන් ඒ තුළට කෘමීන් වැනි සතුන් ඇතුළු වීමෙන් වළක්වා ගැනීමට ද පුළුවන.

වැසි ජලය රැස් කිරීම

සාමාන්‍යයෙන් උතුරු මැද පළාතට වාර්ෂිකව මිලිමීටර් 900-1000 ප්‍රමාණයේ වර්ෂාවක් ලැබෙන අතර, එම වර්ෂාවෙන් සියට හැත්තෑ පහකට වැඩි ප්‍රමාණයක් ලැබෙන්නේ ඔක්තෝබර් සහ ජනවාරි අතර කාලයේදීය. ඉන්පසු එළඹෙන වියළි කාලගුණයේදී (පෙබරවාරි සිට සැප්තැම්බර්) ඉතා ආකාරයෙන් එකතු කර ගත් ජලය පානය කිරීමට හැකියාව පවතී.

කෙසේ වෙතත් අනුරාධපුරය වැනි ප්‍රදේශයක නිවෙසක වහලයක මීටර් පනහක පමණ ප්‍රමාණයකින් සහ මීටර් හතලිහේ සිට හතළිස් දහස දක්වා වැසි ජලය එකතු කර ගැනීමේ හැකියාවක් පවතී. එය දිනකට නම් ලීටර් එකසිය හවයකි. ලීටර් අට දහසක ධාරිතාවකින් යුත් ජලය ගබඩා කළ හැකි ටැංකියකින් පස් දෙනෙකුගෙන් යුත් පවුලකට වියළි මාස හය අවක කාලයක් පානීය ජල අවශ්‍යතාව සපුරා ගැනීම සහ ආහාර පිස ගැනීම කළ හැකිය. මෙම පහසුකම එක් නිවෙසකට ලබාදීම සඳහා (භාවිත කළ ජලය ඉවත් කිරීමේ ක්‍රමවේදය ඇතුළුව) වැය වන්නේ රුපියල් හැටපන් දහසක පමණ මුදලකි.

හන්තාන මූලික අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂක මහාචාර්ය
සමන් සේනවීර

මේ සඳහා ෆිල්ටර්, ජල පොම්ප වැනි මිල අධික උපකරණ අවශ්‍ය නොවේ. සෙවිලි කරන ලද හෝ පොල්අතු වහල සහිත නිවාසයක සෙවිලි කරන ලද ප්‍රදේශයට ඉහළින් වෙනම පොලිතින් ආවරණයක් වැසි කාලයේදී සකස් කර ගැනීමෙන් ජලය එකතු කර ගත හැකිය. මේ සඳහා නඩත්තු වියදමක් දැරීම අවශ්‍ය නොවේ. භාවිත කරන ජලය ඉවත් කරන පද්ධතිය වසර පහකට වරක් මාරු කිරීම ප්‍රමාණවත්ය. වසර දහයකට වැඩි කාලයක් තුළ ජලය ලීටරයක් සඳහා වැය වන්නේ දළ වශයෙන් සත විසි පහක පමණ මුදලකි.

තව ද මෙම තාක්ෂණය ඉතාමත් සරලය. පහසුවෙන් ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට අවබෝධ කර ගත හැකිය. ක්‍රියාත්මක කිරීමත් ලෙහෙසිය. ඉන්ධන වැය කිරීමක් අවශ්‍ය නොවේ. ශ්‍රී ලංකාවේ 2005 වසරේ සිට වැසි ජලය උපයෝගී කර ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් හා සැලැස්මක් ද තිබේ.

ශ්‍රී ලංකාව තුළ වැසි ජලය එකතු කිරීම

පසුගිය දශක කිහිපයේ මෙරට තුළ පළාතකම ක්‍රියාත්මක වූ වැසි ජලය එකතු කිරීමේ විවිධ ව්‍යාපෘතීන් තුළින් ගෘහ ආශ්‍රිත ඒකක 42000 ක ඉදිකිරීම අවසන් කර ඇත. එසේත් මෑතකදී ඒ පිළිබඳව සිදු කළ අධ්‍යයනයකදී පෙනී ගොස් ඇත්තේ, ඒවායේ අතුමෙන් තාවත්තුව නිසා වැඩි කොටසක් අනතුරේ ලබා ඇති බවයි.

ආරම්භයේදී ජල ටැංකි ඉදිකිරීම හා ඊ ආශ්‍රිත කොටස් සකස් කිරීම සඳහා වැඩි මුදලක් වැය වන බැවින් සාමාන්‍ය ජනතාව ඒ සඳහා යොමු වන්නේ අඩුවෙනි. කෙසේ වෙතත් මෙම ඒකක සකස් කිරීමේදී තවදුරටත් ඒවා භාවිත කිරීමට පහසු වන ආකාරයෙන් සකස් කිරීම, ජලයේ තත්ත්වය වැඩි දියුණු කිරීම මෙන්ම විශාල ජනතාවකට ජලය ලබා දීමට හැකි වන ආකාරයෙන් ටැංකි සකස් කිරීමට හැකියාව පවතී. එමෙන් වැසි ජලය එකතු කිරීමේ පද්ධති කුඩා ව්‍යාපාර වශයෙන් නිෂ්පාදනය කිරීමට දේශීය නිර්මාණකරුවන්, ව්‍යවසායකයින් පුහුණු කිරීමට හැකියාව පවතී.

අඩු ප්‍රාග්ධනයක් වැය වන ඉතා අඩු නඩත්තුවක්, අවම තාක්ෂණික දැනුමක් ඇති නව නිර්මාණයක් කෙරෙහි මේ වන විට අවධානය යොමු කර තිබෙන බව පර්යේෂණ කණ්ඩායම පවසයි. එහි මූලික පර්යේෂණ කටයුතු ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත ඇග්‍රිකෝලා සංවිධානයේ විද්‍යාඥයින්ගේ මූලිකත්වයෙන්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය හා ලංකා වැසි ජල එකතු කරන්නන්ගේ සංසදයේ සහයෝගිත්වයෙන් දැනටමත් ආරම්භ කර තිබේ. මෙම තාක්ෂණය ප්‍රයෝජනයට ගනිමින් වර්ෂාපතනය ඉතා අඩු ඕස්ට්‍රේලියාවේ ප්‍රදේශ කිහිපයක වසර 200ක කාලයක සිට ගෘහස්ථ පරිභෝජනයට අවශ්‍ය ජලය සපයා ගනී.

මෙම ක්‍රමයේදී වර්ෂා ජලය එක්රැස් කිරීම ගෘහස්ථ මට්ටමින් නිර්මාණය කරන අතර, වර්ෂාව ඇතිවන අවස්ථාවලදී වහලය මගින් පසළුව ගලාගෙන එන ජලය වැසි පීලිල්ලේ පවතින නිශ්චිත ස්ථානයකදී කුටීරයකට යොමු කරනු ලැබේ. එහි ඇති කුඩා පෙරනයක් මගින් වර්ෂා ජලයේ පවතින කුඩා අංශු රොඩු ඉවත් කෙරේ. මේ ආකාරයෙන් පෙරනය තුළින් ගමන් කළ ජලය නළ මාර්ගයෙන් භූමියේ ඇති ටැංකියට යොමු කරයි. එසේත් මෙම ටැංකි ජල ටැංකිය හා වහලය අතර නිර්මාණය කරන හැරවුම් නළය මගින් වර්ෂා ජලය කල්දුවම ටැංකියට ජලය ගලායාම වළක්වා එනම් නළයේ ඇති උපකරණ කිහිපයක් මගින් පිරිසිදු කර ජල ටැංකියට ලබාදීම සිදු වේ. පසුව ටැංකියට එකතු වූ ජලය ද මෝටරයක් මගින් ඉවතට ගෙන තවදුරටත් පිරිසිදු කර පානය සඳහා ලබා දීම සිදුවේ.

ග්‍රාමීය ජනතාව අතර මෙම තාක්ෂණය ප්‍රචලිත කිරීම සඳහා රජයේ සහ පෞද්ගලික බැංකු මගින් ණය සහන ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කරදීමට ද පියවර ගත හැකිය.

හන්තාන මූලික අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂක මහාචාර්ය සමන් සේනවීර මහතා සමග ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලයේ විද්‍යාඥ ආචාර්ය සුනිල් මණ්ඩාර කොන්නකෝන්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය තමින් ජිනදස, ලංකා වැසි ජලය රැස් කරන්නන්ගේ සංසදයේ අධ්‍යක්ෂිකා ආචාර්ය තනුජා ආරියානන්ද මහත්ම මහත්මීහු ද මෙම නව වැසි ජල ටැංකි නිර්මාණ ව්‍යාපෘතිය සඳහා දායකත්වය සපයමින් සිටිති.

**ස්තූතිය - හන්තාන මූ[lik]**
**අධ්‍යයන ආයතනයේ මා[...]**
**නිලධාරි ප්‍රදීප් පියතිලක මහ[...]**

සිසිර කුමාර බණ්ඩාර


## ඩුබායි ඇබෑර්තු Dubai ආරක්ෂක නිලධාරීන්

ARKAN
Security Management System

ප්‍රමාණය 38
AED 2200
LKR 101,200

අයදුම්පත් සඳහා කිසිදු ගාස්තුවක් අය නොකෙරේ
අයදුම්පත් සැදවීම සඳහා පමණි

(AED.1 = Rs. 46/=)

සේවා හා කොන්දේසි
• ආහාර නොසපයේ
• නවාතැන්, ප්‍රවාහන සහ වෛද්‍ය පහසුකම් නොමිලේ.
• සේවා කාලය දිනකට පැය 12යි

සම්මුඛ පරීක්ෂණ විදේශ නියෝජිතයන්ගේ සමග

Send Your CV's to - cv.ibrahimgroup@gmail.com / azam@ibrahimgroup.lk

077 9077050 / 077 2301850 / 077 2293041 Approval No : AL/ADVT/833/11/18
011 4060280 / 011 7324324 / 011 4363396 / 011 4363369

IBRAHIM ENTERPRISES (PVT) LTD.
නො:116, යෝර්ක් වීදිය, පළමු මහල, කොළඹ 01
(කොළඹ හිල්ටන් හෝටලය අසල) (සෙනසුරාදා, ඉරිදා විවෘතයි)
L.L.NO 833 0112 392 011 / 0112 392 012 / 0114 060 280
twitter.com/ibrahimenterprises Email - cv@ibrahimgroup.lk

## ඇබෑර්තු පුහුණු/නුපුහුණු (පිරිමි

▸ ඉලෙක්ට්‍රොනික් ටෙක්නීෂියන්
▸ ගෘහවිදුලි උපකරණ පරීක්ෂා කරන්නන් (QC)
▸ අත්උදව්කරුවන්

උදේ, දවල්, රාත්‍රී ආහාර සහ නවාතැන් පහසුකම් නොමිලේ

• ආහාර/නවාතැන් පහසුකම් නොමිලේ
• ප්‍රසාදක දීමනා
• රක්ෂණ ආවරණ
• දක්ෂතාවය අනුව වැටුප් වැඩිවීම
• උපස්ථිම
• දිරිදීමනා
• පැමිණීමේ දීමනා

07777 596 92, 077 397 94 77

## ඒපී.ලංකා පුද්ගලික සමාගමේ පහත සඳහන් ඇබෑර්තු ඇත.

1. විදුලි කාර්මික ශිල්පී (අවුරුදු 01ක පළපුරුද්ද)
2. සාමාන්‍ය සේවක
3. වැල්ඩින් වැඩ සඳහා සේවක මහත්වරුන්

අමතන්න - 0710 715 584
සහතිකයන් පහත ලිපිනයට පැමිණෙන්න

ඒපී. ලංකා පුද්ගලික සමාගම
නො 416/5 ...